# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2006 අංක 51 දරන ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බදු පනත

---

[සහතිකය සටහන් කළේ 2006 දෙසැම්බර් මස 15 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---


2006 දෙසැම්බර් මස 15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1. රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 4.25 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

**2006 අංක 51 දරන ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බදු පනත**

[සහතිකය සටහන් කළේ 2006 දෙසැම්බර් මස 15 වන දින]

එල්. ඩී. —ඕ. 80/2006

2007 අයවැය යෝජනාවලට ආනුෂංගිකව ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධනය සඳහා යොදාගත යුතු වූ ද ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බද්ද යනුවෙන් හඳුන්වනු ලබන්නා වූ ද බද්දක් පැනවීම පිණිස ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1\. (1) මේ පනත 2006 අංක 51 දරන ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බදු පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

(2) මේ පනතේ විධිවිධාන සියළු කාර්ය සඳහා 2006 නොවැම්බර් මස 17 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

2\. 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නිෂ්පාදන බදු ගෙවීමට යටත් වන සියලුම මෝටර් වාහන මත, එම මෝටර් වාහනය ආනයනය කරන අවස්ථාවේ දී, (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනතේ ඉ උපලේඛනය ප්‍රකාර නිශ්චය කරනු ලබන, එම මෝටර් වාහනයේ රේගු වටිනාකම සහ ඒ මත අයකරනු ලබන සියලු බදු, ගාස්තු හා අයකිරීම්වලින් සංයුක්ත වන සම්පූර්ණ වටිනාකම මත සියයට 2.5 අනුප්‍රමාණයක ප්‍රමාණයට ගණන් බලනු ලබන (මෙහි මින් මතු "බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බද්ද යනුවෙන් හඳුන්වනු ලබන බද්දක් පනවා ආනයනය කරන අවස්ථාවේ දී අයකර ගනු ලැබිය යුතු ය. — ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බද්ද පැනවීම.

මේ වගන්තියේ කාර්ය සඳහා ඉහත සඳහන් කර ඇති "මෝටර් වාහනය" යන යෙදුමට ත්‍රී රෝද රථ ඇතුළත් නොවිය යුතු ය.

3\. 1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනතේ විධිවිධාන අදාළවන යම් රාජ්‍යයක දූත මණ්ඩලය විසින් හෝ යම් සංවිධානයක් විසින් යම් සේවයක් සැපයීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන යම් මෝටර් වාහනයකට 2 වන වගන්තියේ සඳහන් කිසිවක් අදාළ නොවිය යුතු ය. — නිදහස් කිරීම.

4\. මේ බද්ද අය කර ගැනීමේ කාර්ය සඳහා සහ මේ පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, එය නොතකා බද්ද (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත යටතේ ගෙවිය යුතු රේගු බද්දක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව රේගු ආඥාපනතේ විධිවිධාන, එම බද්ද අයකර ගැනීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය. — බද්ද රේගු බද්දක් ලෙස සැලකිය යුතු බව.

2—PL 001641-4,650 (2006/12)

බද්ද ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කළ යුතු බව.

**5**. බද්ද වශයෙන් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අයකර ගනු ලබන සියලු මුදල් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

වගකීමෙන් මුක්ත වීම.

**6**. 2006 නොවැම්බර් මස 17 වන දිනයෙන් ආරම්භ වී, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයෙන් අවසන් වන කාල සීමාව තුළ මේ පනත ප්‍රකාර ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බද්දක් ලෙස රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් යම් මුදලක් එකතු කර ගෙන ඇති අවස්ථාවක, එසේ එකතු කර ගනු ලැබූ ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බද්ද, වලංගු ලෙස එකතු කරගෙන ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, එකී බද්ද අයකර ගැනීම සම්බන්ධයෙන් එම අදාළ බලධරයන්ට එරෙහිව යම් සිවිල් හෝ අපරාධ නඩු පවරනු ලැබීමෙන් ඔවුන් මුක්ත කරනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**7**. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.